# රත්නපුර ප්‍රාදේශිය සභාව 2022.11.11 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2022.11.11. වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03 | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | ටී.ජී.ඉන්ද්‍රාණී මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | අයි.ඩබ්ලිව් අඛිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | යූ.කේ නන්දාවතී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | ගෝපාල් තම්බිරාජා මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | කේ.ඒ.ජයරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | වජිරා නන්දනී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | උදය කුමාර් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 31. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 32. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 33. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | |
|---|---|---|
| 01. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | ඩී.නිලන්ති දිපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.10.07 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව.එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙන් පවත්වන ලද පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/20** ව හැදෑරීම සඳහා මෙම සභාවේ සංවර්ධන නිලධාරීන් වන ශ්‍යාමා මුණවීරගේ මහත්මිය, ජී.එච්.අයි.ඩී ආරියමිත්‍ර මහත්මිය, සංජීවනී නිරෝෂි පහළවිතාන මහත්මිය යන අය විසින් සාර්ථකව හදාරා සහතික පත් 2022.11.08 වන දින ලබාගත් බවත්, ඒ සඳහා වැයවූ පාඨමාලා ගාස්තු සභා අරමුදලින් දැරීම සඳහා අනුමැතිය ලබා දුන් ගරු සභාවට තමන්ගේ ස්තූතිය පුදකර සිටින බව එම නිලධාරීන් තිදෙනා විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කළේය.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව**

**ඉදිරියේ තැබීම.**

I. ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා විසින් එවන ලද 2022.11.01 දිනැති "රත්නපුර - ශ්‍රී පලාබද්දල අධ්‍යාපන කොට්ඨාශයේ තුන්වන අධ්‍යයන වාරය පිළිබඳවයි " මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතට අනුව රත්නපුර ප්‍රාදේශීය සභාව විසින් විනෝද බදු අයකිරීමට කටයුතු කිරීමේ යෝජනාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ii. හෙට්ටිකන්ද ක්‍රීඩාපිටිය අත්පත් කරගැනීමට කටයුතු කිරීමේ යෝජනාව - ගරු මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iii. 2005 වර්ෂයේ අතුරලිය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දී ඇති රු:-12640.00ක නොපියවූ අත්තිකාරම් මුදල කපා හැරීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, මෙවැනි සිදුවීම් ඉදිරියට නොවීමට වගබලා ගතයුතු බවත් , මෙම මුදල් ශේෂයන් ඉදිරියට යාම හේතුවෙන් විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම දිගින් දිගටම සිදුවන බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iv. සභාවේ ගරු මන්ත්‍රීවරුන්, කාර්යය මණ්ඩලය හා කොට්ඨාශයේ ආධුනික ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් ව්‍යවසායකත්වය පිළිබඳව පුහුණු වැඩමුළුවක් 2022.11.18 දින පැවැත්වීම වෙනුවෙන් සභා අරමුදලින් වැය දැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iv. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය සභාසම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා , ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි යන මහත්වරුන් විසින් පවසා සිටියේ අයවැය සකස් කිරීමේදී සංශෝධනය විය යුතු කරුණු කිහිපයක් තවත් ඇති නමුත් 2023 වර්ෂය සකස් කර ඇති යවැය ලේඛනයට තම කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන ඇතුලත් කර ඇති බැවින් මෙම අයවැයට තම කණ්ඩායම විරුද්ධ නොවන බවත්, ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා ප්‍රකාශ

කළේ ප්‍රතිපත්තියක් විදියට මෙවර අයවැයටද තම විරෝධය එල කර සිටින බවත් ය. මේ අනුව වැඩි දෙනාගේ අනුමැතියට අනුව 2023 වර්ෂයට අදාලව සකස් කරන ලද අයවැය ලේඛනය ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී.

05:01 හදිසි යෝජනා

i. රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අයිතිකරුවෙකු නොමැති අයාලේ යන ගවයන් අල්ලා ගාල් කර ගව පාලනයක් ඇති කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ අනුව දැනට මේ සම්බන්ධව සාර්ථකව කිරි ගව පාලනයේ යෙදෙන පාසැළ අසළ, කොස්වැටිය ,පල්ලෙබැද්ද ලිපිනයැති පී.ජී. නිරෝෂ ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛණ ද ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස වූයේ එම කටයුත්ත බල ප්‍රදේශයේ කෙනෙකු යොදවා විධිමත් පරිදි ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීම සුදුසු බවයි. ඒ අනුව කිරි ගව පාලනය ව්‍යාපෘතියක් ලෙස රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2022.10.28 වන දින මුදල් කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**i.ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා**

අයවැය පිළියෙල කිරීමේදී සියළුම මන්ත්‍රීවරුන් කැඳවා සාකච්ඡාවක් සිදුකළා ඒ සඳහා රොහාන් මන්ත්‍රීතුමා හා බෝතුංග මන්ත්‍රීතුමා අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු ලැබුවා අනුර ප්‍රභාත් මන්ත්‍රීතුමා මේ සාකච්ඡාවට සහභාගී වුනේ නෑ සහභාගී වුනා නම් මෙවර අයවැයට විරුද්ධ නොවන බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය.

සභා බල ප්‍රදේශය තුළ ළමා උද්‍යානයක් ඇතිකිරීමට හැකියාවක් තිබේනම් එය වටින බවත්, අනෙකුත් නගරවල ළමයින්ට පැමිණ සෙල්ලම් කිරීම සඳහා මෙවැනි ස්ථාන ඇති කර ඇති බවත් , මේ සඳහා මුදලක් වෙන් කර 2023 වර්ෂයේදී වත් එවැනි දෙයක් මෙම වසරේ මුදල් ඉතිරියක් සිදුවී ඇත්නම් සිදුකිරීම සුදුසු බව එතුමා සඳහන් කළේය. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය පිළිබඳව තමන්ට සතුටු විය හැකි බවත් එය සභා සම්මත කිරීම සුදුසු බවත් සඳහන් කරමින් එතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

එදා සිටි තත්වයේ හැටියට අදවන විට සභාවේ තත්වය පිළිබඳව සතුටු විය හැකි බව එතුමා සඳහන් කළේය. ගිලීමලේ සභාව පවත්වන කාලයේ පුටුවක් වත් හරියට නොතිබූ බවත් , මේ වන විට සභා රැස්වීම පවත්වන ස්ථානය පිළිවෙළකට ගරුත්වයක් ඇතිව කටයුතු කළහැකි පරිදි සකස් කර ඇති බව එතුමා සඳහන් කළේය.

පසුගිය සතියේ විශාල චෝදනාවක් සමගින් දූරකථන ඇමතුම් ගලා එන්නට පටන් ගත්තා බඹරකොටුව කලාපයේ සමෘද්ධි බැංකු සංගමයේ අයතා ගණුදෙනුවක් සිදුවූ බවට . සමෘද්ධි සහනාධාර බෙදා දීමේදී සමෘද්ධිලාභීන්ගෙන් මෙම කොට්ඨාශයට අදාල සමෘද්ධි නිලධාරියා දැනුවත්ව ඒ අනුගාමිකයන් ලවා මේ කටයුතු සිදුකරන බවට තමයි දැනගන්නට ලැබී ඇත්තේ. කණගාටුවට කරුණ නම් මි සභාවේ මන්ත්‍රීවරුන්ද මේ සඳහා හවුල් වී ඇති බවට ජනතාව විසින් චෝදනාවට ලක් කර තිබීමයි. මේ පිළිබඳව ලිඛිතව ඇතැමුන් ලබා දී තිබෙනවා. සමෘද්ධි වැඩසටහන තුළ මෙවැනි දේ සිදුවීම අපේ රජයත් අපහසුවට ලක්වන බවද, සඳහන් කළ එතුමා පවසා සිටියේ මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම් හෝ ආණ්ඩුකාරවරයාට මේ පිළිබඳව දන්වා කඩිනමින් විමර්ෂනයක් සිදුකිරීම සඳහා කටයුතු කළයුතු බවයි. මේ වන විටත් ඇතැම් පිරිස් වෙතින් මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් හා සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මගින් යොමුකර ඇති බවද එතුමාට දැනගන්නට ලැබුණු බව එතුමා සඳහන් කළේය.

**ii.ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා**

හපුගස්තැන්න හා දෙහෙනකන්ද වසම සමෘද්ධි සහනාධාර ලබා දී තිබෙනවා. සමෘද්ධි මුදල් , වැඩිහිටි මුදල් , ආබාධිත මුදල් වලින් හා පිටරටින් එන ආධාර මුදලින් පන් දහසක් තුන්දහසක් ආදී වශයෙන් වංචා

කරලා තිබෙන බවට ෆේස් බුක් වල දාලා තිබුණා. ඊට මන්ත්‍රීවරුන්ද සම්බන්ධ බව සඳහන් කර තිබුණා. මම දෙවන වරට තමයි මේ සභාවෙ මන්ත්‍රී වරයෙක් ලෙස කටයුතු කරන්නේ මං කිසිදාක වංචා කරලත් නැහැ සොරකම් කරන මිනිසුන් ආශ්‍රය කරන්නෙත් නැහැ. වසම තුළ සල්ලි එකතු කරා කියන කතාව 90%ක් ඇත්ත. රුපියල් ලක්ෂ 8ක්ට ආසන්න ප්‍රමාණයක් වංචා කර ඇති බවට දැනගන්නට ලැබෙනවා ඇත්තටම එය කණගාටුවට කරුණක් බව එතුමා සඳහන් කළේය. මෝහන් මන්ත්‍රීතුමා , සහ උදය කුමාර් මන්ත්‍රීතුමා මේ පිළිබඳව ෆේසබුක් වල තිබෙනවා ඔයා දැක්කේ නැද්ද කියලා මගෙන් ඇහැව්වා මං ඊට පස්සෙ බැලුවා මේ දෙන්නා කොමේන්ට් කරලා තිබුණා අනතුරුව මාත් කොමෙන්ට් කරා මම සාධාරණව හම්බ කරන මිනිහෙක් අනුන්ගේ දේ වංචා කරන්නේ නැහැ . එහෙම කරපු අයට දෙයියන්ගේ සාපය වැදෙන්න ඕනි කියලා. ඊට පස්සෙ මේ මන්ත්‍රි තුමාලට සියළුම දෙනාට කතා කරලා ඇහැව්වා මේ සිද්ධියට කුමක්ද කරන්නේ කියලා. මෝහන් මන්ත්‍රී තුමා කොළඹ සිටින නිසාත් 23 වන දා දීවාලී තිබෙන නිසාත් 26 වනදා මේ පිළිබඳව සොයා බැලීමට ගමට යමු කියලා කිව්වා .ගමට ගිහින් මිනිස්සුන්ගෙන් අහපුවාම මේ සිද්ධිය ඇත්ත බව පිළිගත්තා . කොට්ඨාශ හයේම මුදල් එකතු කර ඇති බව එතුමා පැවසුවේය. මෝහන් මන්ත්‍රීතුමාත් උදය කුමාර් මන්ත්‍රීතුමාත් 28 වෙනිදා ශෂි කුමාර් යන අයගේ නිවසේ සිට සාකච්ඡා පවත්වා තිබෙනවා මේ පිළිබඳව මොවුන්ගෙන් විමසූ විට පැවසුවේ විවිධ හේතුන් නිසා මෙම නිවසට පැමිණි බවයි. නමුත් මොවුන් මේ වැඩ සිදුවීම සම්බන්ධ තොරතුරු දන්නා බවයි මගේ හැඟීම. මෝහන් මන්ත්‍රී තුමාට මම ෆෝන් එකෙන් කතා කළ සියළුම දේ රෙකෝඩ් කර ශෂි කුමාර්ට ලබා දී ඇති බවත්, ඔහු විශ්වාස කරමින් පැවසූ සියළුම දේ වෙනත් අයෙකුට කීම තුළින් තමන් පාවා දී ඇති බව එතුමා සඳහන් කළේය. මෙම මන්ත්‍රීවරුන් සමඟ සහයෝගයෙන් වැඩ කළත් අවසානයේදී පිටුපස සිට බෙල්ල කැපීම නිසා ඉතාමත් කළකිරීමට පත්වුන බව එතුමා සඳහන් කළේය.

මේ සිද්ධිය සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් තුමියට ලිපියක් ලිව්වා , තාම පිළිතුරක් ආවේ නැහැ ජීවන් තොණ්ඩමාන් මැතිතුමාටත් දැනුම් දුන් බව එතුමා සඳහන් කළේය. මේ සම්බන්ව කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් විසින් සොයා බලන්නැහැ කියන නිසා මාවිසින් ලිපියක් යොමු කරනු ලැබුවා. මේ මන්ත්‍රීවරුන් දෙදෙනා ලිපි යොමු කරාද නැද්ද කියන්න මං දන් නැහැ. නමුත් මේ පිළිබඳව පරීක්ෂනයක් සිදුකර සත්‍ය හෙළි කර ගැනීමට කටයුතු කළයුතු බවත්, මේ සභාවට මං කියන්නේ මම නම් මෙයට කිසිදු සම්බන්ධයක් නැහැ. මං සාධාරණ විදියට හම්බ කරමින් ජිවත් වන්නේ අහිංසක මිනිසුන්ගේ සල්ලි සොරකම් කරන්න මට අවශ්‍යතාවයක් නෙමැති බව එතුමා පැවසූ අතර, මේ සම්බන්ධව පරීක්ෂනයක් පවත්වා සත්‍ය සොයා ගතයුතු බව එතුමා පැවසුවේය.

පසුගිය කාලයේ අපේ වසමේ ගැබිණි මවකට මහමඟ දරුවා ප්‍රසූතියට ලක්වුනා ඒ අවස්ථාවේදී ඒ දරුවා මිය ගියා මෙම වසමේ මාර්ග පද්ධතියේ තිබෙන ගැටළුකාරී තත්වය හේතුවෙන් මිනිසුන් ප්‍රවාහනයේදී මහත් පීඩාවන්ට ලක් වෙනවා ඒ නිසා මෙම මාර්ගය ශ්‍රමදාන මට්ටමින් හෝ පිළිසකර කර ගැනිම සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලීම් කරන බවත්, කොට්ඨාශයේ පවතින ජල ගැටළු විසඳීමට කටයුතු කරන ලෙසත් ගරු සභාවෙන් එතුමා ඉල්ලීමක් කළේය.

**iii.ගරු මන්ත්‍රී නිලන්ති අමරකෝන් මහතා**

මම මේ සභාවට පත්වූ පළමු අවස්ථාව මෙයයි. කණ්ඩායමක් විදියට ගරු සභාපතිතුමා එක්ක සෑම වැඩක්ම ගුණාත්මකව කරන්න සහයෝගයක් දුන්න මන්ත්‍රීවරියක් තමයි මම. පැත්තකට වෙලා ඉඳලා කොමිස් වලට තීන්දු තීරණ වලට අත් උස්සා නොමැති බවත් , ගියවසරේ සභාපතිතුමා ඉදිරිපත් කළ අයවැය සඳහා දෙපාරක් මම විරුද්ධ වුනා තුන්වැනි වතාවට පක්ෂව ඡන්දය ලබා දුන්නා ඒ දුන්නේ මට වාසියකට නොවෙයි. මං සෑම විටම කටයුතු කරන්නේ මහජනතාව වෙනුවන් මම වගකියන්නේ ජනතාවට මිසක් මේ සභාවටවත්, මන්ත්‍රිවරුන්ටවත් නොවන බව එතුමිය සඳහන් කළේය.සාධාරණය වෙනුවෙන් පෙනී හිටින්න තමයි ඒ මිනිස්සු නායකයා විදියට මාව පත් කරලා තියෙන්නේ. මගේ වගකීම වන්නේ මෙතන තියන හොරවැඩවලටවත්, කොමිස් වැඩවලටවත් උදව් කරන එක නොවන බවත් එතුමිය පැවසුවේය. ෆේස් බුක් එකේ සභාවේ කර්ටන් සවි කිරීම සම්බන්ධව දැක ලන්නට ලැබුනේ තමන්ගේ ෆේස්බුක් එකේ බවත්, එවැනි ක්‍රියා සිදුවේද්දී සභාවේන ගිය වසරේදී තමන්ට ලබා දීමට නියමිතව තිබූ වීථි ලාම්පු පහවත් නොලැබීම සම්බන්ධව කතා කළ බව එතුමිය පැවසුවේය. මෙ ලබා නොදීමට හේතුව වුයේ ගියවර අයවැයට විරුද්ධව ඡන්ද දිපූ නිසා බව එතුමිය සඳහන් කළේය. කොට්ඨාශයේ අළුත් වැඩියා කළයුතුව ඇති වීථි ලාම්පු පවා ඒ ආකාරයටම තිබෙන බවත්, කොපමන දැනුම් දුන්නද ඒවා සිදු නොවන බව එතුමිය සඳහන් කළේය. රෝසි සේනානායක ටොයිලට් එක හැදුවා වගේ මේ වෙලාව නොවෙයි මේවා කරන්න නැත්නම් මේවා කළ යුතුයි. සභාපතිතුමාගේ කැබ් රථය ලක්ෂ හයයි ගාණක් වැය කර සෑදූ වෙලාවෙත් මං කිව්වේ ඒකයි. මේ සියළුම දේ කර ගන්නවනම් කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් මොනවද කරන්නේ කාටද අපි මේ වා කියන්නේ .මුදල් කාරක සභාවේ මහත්තුරු මේ වා කතා කරන්නේ නැත්නම් සභාවේ මේවා කථා කළ යුතු වෙනවා. මං ලක්ෂ එකහමාරක් විතර වැය වන පොඩි පාරක් ඉල්ලුවා මගේ කොට්ඨාශයට තමයි අඩුවෙන්ම ප්‍රතිපාදන ලැබිලා තියෙන්නේ .හේතුව මොකද කියන්න මං දන්නේ නැහැ. සේවා පියසේ තාප්පය කඩා වැටිලා තියෙනවා ඒක සභාවේ බැක්හෝ යන්ත්‍රය යොදවා අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙස ඉල්ලුවත් ඒවා කෙරෙන්නේ නැහැ. සභාපතිතුමාට කිව්වත් කෙරෙන්නේ නැත්නම් ජනතාවට වගකියන මන්ත්‍රීවරියක් ලෙස මේවා කතා කළ යුතු වෙනවා.

ලබාදෙනවා කියූ වීදී ලාම්පු 20න් 6ක් තවමත් නොලැබීම සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

කර්ටන් දාපු එක හොඳයි රෝසි සේනානායකට වගේ අපිට සතුටු වෙන්න පුළුවන් ආඩම්බර වෙන්න පුළුවන් නමුත් මේ සභාවේ සිදුකෙරෙන කණ්ඩායම් හැඟීමෙන් තොරව සියළුම දේ පිළිබඳව දැඩි කලකිරීමක් ඇති බව එතුමිය සඳහන් කළේය.

**iv.ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා**

සමෘද්ධි මුදල් වංචා කිරීම සම්බන්ධව පරීක්ෂනයක් සිදුකර වාර්තාවක් ලබා ගැනීම කළයුතුව ඇති බවත්, මුදල් ගත් පුද්ගලයා කියන්නේ සල්ලි ගත්තනම් ඔප්පු කරන්න කියලා . සල්ලි තමන් ගිහින් එකතු කරන්න නැතුව ඇති නමුත් සල්ලි අරන් තියෙනවා. ලිඛිත සාක්ෂි තියෙනවා. මේ පිළිබඳව විමර්ෂනයක් කළ යුතුමයි. මෙම රාජ්‍ය මුදල් අවභාවිතයක් නිසා සභාවෙන් මේ පිළිබඳව පරීක්ෂා කර වාර්තාවක් ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

**v.ගරු මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතා**

මගේ කොට්ඨාශයේ පාරවල් කිහිපයක් සංවර්ධනය කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තමා විසින් ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවා ඒ පිළිබඳව එතුමාට මේ අවස්ථාවේදී ස්තූති වන්ත වන බව ගරු මන්ත්‍රීවරයා සඳහන් කළේය.

මගේ කොට්ඨාශයේ කම්බි පාළම් 3ක් තියෙනවා මේවා පිළිසකර කර දෙන්න කියලා මම දැන් වසර තුනක් තිස්සේ කියනවා. කම්බි පාළම් පිළිසකර කිරීම විෂයක් ලෙසද සභාවට පැවරිලා තිබෙන බව එතුමා සඳහන් කළේය. බටේවෙල උතුර කන්ද කම්බි පාළම හා කෙම්පනාවත්ත නාහිටිය කම්බි පාළම හා අමුණු තැන්න කෙම්පනාවත්ත යන පාළම් මේ වන විට ගමන් කිරීමට නොහැකි තත්වයට අබලන් වී ඇති බවත් , මේ වන විට දරුවන් පාසැල් යන්නේ කිතුල් පටි යොදාගෙන යම්කිසි දවසක මේ වර්ෂා කාලයේ පාළම කඩාගෙන කවුරුන් හෝ ගඟට වැටුනොත් ඒ වගකීම සභාවක් ලෙස අපිට ගැනීමට සිදුවන බව එතුමා පෙන්වා දුන්නේය. මෙම පාළම් තුන පිළිසකර කර දීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස මේ පිළිබඳව ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

සමෘද්ධි සහනාධාර බෙදා දීමේදී සමෘද්ධි ලාභීන්ගෙන් මුදල් එකතු කර ඇතැයි කියන සිද්ධිය පිළිබඳව සොයා බැලීමක් සිදුකළ යුතු බවත්, තමන් ද සමෘද්ධි නිලධාරියෙකු වශයෙන් මෙම කොට්ඨාශයේ කටයුතු කර ඇති බවත්, තමන් රාජකාරී කරන ලද ප්‍රදේශයේ මෙවැනි සිදුවීම් වීම නොවිය යුතු බව එතුමා පැවසුවේය. බඹරබොටුව සමෘද්ධි බැංකුව මේ වන විට ඉතා අමාරුවෙන් ගොඩ නගාගත් පසුබිමක් සහිතව තිබෙනවා මේ කලාපයේ කිසිදු අවස්ථාවක මෙවැනි දේ සිදු වී නැහැ .ඒ නිසා මෙම බැංකු සංගමයට , සමෘද්ධි නිලධාරීන්ට අපකීර්තියක් වීම සිදු නොවිය යුතුයි. මෙවැනි සිදුවීම් වතු ආශ්‍රිත කොට්ඨාශ වල තමයි ඇතිවන්නේ එසේ සිදුවී ඇතිනම් එම නිලධාරියාට පමණක් පරීක්ෂනයක් සිදුකරන ලෙසත් සමස්තයක් ලෙස සමෘද්ධි වැඩසටහන අපකීර්තියට ලක් නොවිය යුතු බව එතුමා පැවසුවේය.

සභාව අලංකරණය කිරීම පිළිබඳව කතාවක් ඇති වුනා මේ සමාජ මාධ්‍යතුළින් තමයි මේ සමාජය විනාශ කරන්නේ වැඩකට නැති කාලකන්නියෙක් මොකක් හරි කමෙන්ට් එකක් දැම්මොත් ඒක පස්සේ ගිහින් විවිධ මත හදනවා. අපි ඉන්න තැන පිළිවෙළකට තිබිය යුතුයි. සභා රැස්වීම පැවැත්වෙන ස්ථානයේ ගාම්භිරත්වයක් තිබිය යුතුයි. මේ සභාව ගෞරවාන්විතව ආපසු බාර දිය යුතුයි. මේ ආකාරයට ගෞරවාන්විත ස්ථානයක් බවට පත් කිරීම පිළිබඳව තම ස්තූතිය එල කර සිටින බව එතුමා ප්‍රකාශ කළේය.

**vi.ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

පෙර ලිපිය මගින් ඉදිරිපත් කරන ලද මගේ යෝජනාවට අමතරව පාසැල් වල ක්‍රීඩා කටයුතු කළයුත්තේ පළමු වාරය තුළදී බවද නමුත් මට පොඩි ගැටළුවක් 2022.12.04 තුන්වැනි වාරය ආරම්භ වෙනවා ,දෙසැම්බර් ආරම්භ වන තුන්වන වාරය අදියර දෙකකදී කොටස් වශයෙන් අවසන් වෙනවා 2022 දෙසැම්බර් මස විසි ගණන් වල සිට ජනවාරි 02 වනදා වන කම් සතියක කඩ කිරීමක් තියෙනවා නැවත දෙවන අදියර කඩකිරීම උසස් පෙල විභාගය සඳහා ජනවාරි 19 සිට පෙබරවාරි මාස 20 දක්වා ආපසු ආරම්භ වන දෙවන අදියර මාර්තු මස 24 අවසන් වන බව දන්වා තිබෙනවා. ක්‍රීඩා කටයුතු සිංහල අලුත් අවුරුද්දට පෙර ආරම්භ නොකළ යුතු බවට මං යෝජනා කරනවා මොකද මේ දෙසැම්බර් සිට මාර්තු දක්වා පවතින්නේ 2022 වර්ෂයේ තුන්වාරයයි. පළමු වාරය ආරම්භ වන්නේ 2023.අප්‍රේල් වලින් පසුව නම් ක්‍රීඩා කටයුතු සිදුවීම ඇතුලත් විය යුත්තේ එම වාරයට බව එතුමා පැවසුවේය. මම දකින්නේ මේ වාරය දික් කරලා තියෙනවා එකක් සාමාන්‍ය පෙළ නිසාත් අනික උසස් පෙළ නිසාත් , මේ අයුරින් කාලය දික් කරලා තියෙන්නේ අධ්‍යාපන කටයුතු නිසා ක්‍රීඩා කටයුතු එම වාරයේදී සිදු කිරීම සුදුසු නොවන බව එතුමා සඳහන් කළේය. මෙම වාරයේ ක්‍රීඩා උත්සව පැවැත්වුවහොත් මෙවර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ කරන සිසුන්ගේ අධ්‍යාපනයට බාධාවක් වන බවත් එම නිසා ක්‍රීඩා උත්සව පැවැත්වීම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදී සිදුකිරීම සුදුසු බවට යෝජනා කරන බවද එතුමා පැවසුවේය.

ගරු සභාපතිතුමනි අපේ රටේ ලබාදෙන වැඩිහිටි දීමනාව මාස දෙක තුනක් මේ වන විට ප්‍රමාද වී තිබෙනවා. වැඩිහිටි දීමනාව ලබාදෙන්න අනුමත කරලා තිබූ කාර්යාලය තමයි උප තැපැල් කාර්යාලය .නමුත් සෑම ගමකම උප තැපැල් කාර්යාල නොමැති නිසා මෙය ලබා දීමට කටයුතු කළ යුතුව ඇත්තේ ග්‍රාම නිලධාරීගෙන් හෝ ගමේ සිටින වෙනත් නිලධාරියෙකු ලවා ගම තුළටම ගොස් බව එතුමා සඳහන් කළේය. මේ දීමනා ලබන්නේ වැඩිහිටි අසරණ පිරිසක් ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මෙම වැඩිහිටි මුදල් ග්‍රාමනිලධාරීගෙන් හෝ වෙනත් නිලධාරියෙකු ලවා බෙදා දීම කාලෝචිත ක්‍රියාවක් බවත්, වැඩිහිටියන්ට කෙරෙන උපකාරයක් ලෙසට එතුමා පෙන්වා දුන්නේය.

සමෘද්ධි සම්බන්ධව කතා කිරීමේදී මෙම අක්‍රමිකතාව සම්බන්ධව තම්බිරාජා මන්ත්‍රීතුමා ප්‍රාදේශීය ලේකම් තුමිය වෙත යොමු කරන ලද ලිපියේ පිටපතක් මටත් දුන්නා . මේ සම්බන්ධව සොයාබලා කටයුතු කිරීම ප්‍රාදේශීය ලේකම් තුමියගේ වගකීමක් බවද, සභාපතිතුමාට මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම කළ නොහැකි බවත්, මේ සම්බන්ධව මාගේ ඉල්ලීමක් ලෙස ගරු ජනාධිපතිතුමාට හා , ගරු සමෘද්ධි ඇමතිතුමා වෙත මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන ලෙසට ඉල්ලීමක් යවන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

අපි මේ සභාවට යම්කිසි දෙයක් ඉදිරිපත් කරනු ලබන්නේ කණ්ඩායමක් ලෙසටයි. අයවැය යෝජනා ලෙස කණ්ඩායමක් සියළුම දෙනා එකතුවෙලා යෝජනා ටිකක් දුන්නා ජනතාවගේ යහපත හා සුබ සිද්ධිය සඳහා ජනතාව පැත්තෙන් බලලා මේ යෝජනා ටික ක්‍රියාත්මක කළොත් හොඳයි කියලා. ඔබතුමාගේ පැත්තෙන් රජයේ නිලධාරී තුමන්ලා තුමියන්ලා එකතුවෙලා අපි දීපු යෝජනා 90%ක් ඇතුලත් කරලා හදලා දීලා තිබෙනවා. අපි අයවැයට නිශ්ශබ්දව හිටියේ අපි මහජනතාව පැත්තෙන් බලලා කටයුතු කළ ටිකට ඔබලාත් ජනතාව පැත්තෙන් බලලා කටයුතු කර ඇති නිසයි. එහෙම නැතිව ප්‍රතිපත්තියක් ලෙස ගත් තීන්දුවක් නොවන බවත්, අපි අයවැයට විරුද්ධව කටයුතු කිරීමට නොයන බවද, අපි විරුද්ධ වුනත් නැතත් මේ සභාවේ අයවැය සම්මත වෙනවා. නමුත් අපි ජනතාවගේ යහපත වෙනුවෙන් වූ යෝජනා ඉදිරිපත් කර ඒවා ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය කටයුතු කරන බවද, ඇතැම් පක්ෂ මන්ත්‍රීවරුන් ප්‍රතිපත්තියක් විදියට අයවැයට විරුද්ධ වෙනවා .මොන යෝජනාව ගෙනාවත් විරුද්ධ වෙනවා කියන තැන ඉන්නවා. අපිටත් පක්ෂ නායකයො ඉන්නවා ඒ අය හරි තීන්දු ගන්නවානම් විතරයි අපිත් ඒවාට කැමති වෙන්නෙ.නැතුව අන කිරීම්වලට බලපෑම් වලට කටයුතු නොකරන බව එතුමා සඳහන් කළේය.

**vii.ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා**

මේ සමෘද්ධි සහනාධාර සම්බන්ධව ප්‍රශ්නය මුලින්ම ෆේස්බුක් එකේ තමයි දාලා තිබුණෙ මන්ත්‍රීවරුනුත් මෙයට සම්බන්ධයි කියලා දාලා තිබුණා. මං ඒ ගැන තම්බිරාජා මන්ත්‍රීතුමාට කතා කරලා කිව්වා. උදය කුමාර් මන්ත්‍රීතුමාටත් කිව්වා , මම ඒ පෝස්ට් එකට කමෙන්ට් කළා හරි තොරතුර දන්නවනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ග්‍රාම නිලධාරි කාර්යාලය , සමෘද්ධි බැංකුවට තුනටම දන්වන්න කියලා. තම්බිරාජා මහතා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දුන්නා කිව්වා . මේ පිළිබඳව පරීක්ෂා කර බලා ඇත්ත තත්වය සොයා බැලිය යුතු බවත්, අපේ උපරිම සහයෝගය ලබාදෙන බවත්, අපේ නමත් ගෑවිලා තියෙනවා ඒ නිසා උපරිම පරීක්ෂනයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. කිසිම කෙනෙකු කියන් නැහැ මුදල් එකතු කළා කියලා .රොහාන් මන්ත්‍රීතුමා ළඟ ලිඛිතව තියෙනවා කිව්වා ඉතින් ඒවා ඉදිරිපත් කරන්න කියලා කියනවා .අපි ඕන පරීක්ෂනයකට සූදානම් බව එතුමා පැවසුවේය.

**viii.ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා**

සභාවේ 80%ක් සමෘද්ධි සම්බන්ධව තමයි කතා කළේය. නමුත් මේ සම්බන්ධව කවුරුත් කතා නොකිරීම නිසා මාත් නිහඬව සිටි බව එතුමා පැවසුවේය. තම කොට්ඨාශයේ සමෘද්ධි ලාභීන් ලෙස පොරොත්තු ලේඛනයේ විශාල පිරිසක් සිටින බවත්, එම පිරිස් වෙනුවෙන් සමෘද්ධි සහනාධාර ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු තමන් සිදුකරන බවද එතුමා සඳහන් කළේය. පොරොත්තු ලේඛනයට තමයි මේ දිනවල මුදල් ආධාර ලබාදීම සිදුකරගෙන යන්නේ. සමෘද්ධි උපකාර්යාලයට ඇවිත් සේවය කරන්න කියලා යෝජනා කරනවා.එයින් ජනතාවගේ අපහසුතාවය මඟහරවාගත හැකි වන බව එතුමා සඳහන් කළේය. සමෘද්ධි නියාමක ඇතුළු පිරිස් සහනාධාර මුදල් මංකොල්ල කනවා කියලා එෆ් බී එකේ දාලා තිබුණා නමුත් කිසිකෙනෙකු ඇවිත් මුදල් දුන් බවක් කියලා නැහැ.කටකතා පමණයි. කට කතාවලින් අපිට පරීක්ෂන කරන්න බැහැ. කවුරුන් හෝ මේ සම්බන්ධව ඔප්පු කිරීමට ඉදිරිපත් වනවා නම් ඒ පිළිබඳව කතා කළ හැකි බව එතුමා සඳහන් කළේය. තම කොට්ඨාශයේ එවැනි සිදුවීමක් සම්බන්ධව කතා කරන්නට සිදුවීම පිළිබඳව කණ ගාටුවන බවත්, තමන්ද අපහසුතාවයට පත්වුනු බව එතුමා සඳහන් කළේය.

ආර්ථික මට්ටමින් ඉතාමත් පහළ තත්වයකට පත්ව ඇති වතු ජනතාව වෙනුවෙන් වගා කටයුතු කරගැනීම සඳහා මේ අයවැයෙන් හෝ වැට ආවරණ ලබා දීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස ගියවර සභාවේදී ත් යෝජනා කළා නමුත් අයවැයෙන් එය ක්‍රියාත්මක වීමක් නැති බව එතුමා සඳහන් කළේය.

දෙහෙන කන්ද වත්තෙන් ඉඩම් දීලා නිවෙස් සාදාගෙන අවු 10ක් 15 ක් තිස්සේ සිටින පිරිස සිටිනවා. නමුත් ඔවුන්ට කිසිදු ඔප්පුවක් හෝ බලපත්‍රයක්වත් නොමැති බවත්, මොවුන්ට මොකක් හෝ නිත්‍යානුකූල ලියවිල්ලක් තිබේනම් බැංකුවකින් ණයක් හෝ අරන් නිවසේ ඉතිරි වැඩ අවසන් කරගත හැකි බවද, මේ

වන විට තිබෙන නිවෙස් එදා තිබූ තත්වයටත් වඩා පහළට ගොස් ඇති බව එතුමා සඳහන් කළේය. මේ පිළිබඳව අදාල ආයතනයන් දැනුවත් කර එම ජනතාවට ඔප්පු ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත් වෙනත් යෝජනාමෙන් මෙම යෝජනාව ඉවත් නොදමන ලෙසත් මේ පිළිබඳව අවධානය යොමුකරන ලෙස ගරු සභාපතිතුමාගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටියේය.

හපුගස්තැන්න පහළ අමුණු තැන්න ප්‍රදේශයේ ගර්භනී කාන්තාවක් රෝහලට ගෙන යාමට ප්‍රමාද වීම හේතුවෙන් එම දරුවා මිය ගියා .මෙසේ ප්‍රමාද වීමට හේතු වුයේ මහ මාර්ගවල තිබෙන අබලන් තත්වය බව එතුමා සඳහන් කළ අතර, සභාවේ බල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග පිළිබඳව තොරතුරු ලබාගෙන අබලන් තත්වයේ තිබෙන මාර්ග සභාවේ බැක්හෝ ලෝඩර් යන්ත්‍රය මගින් හෝ පස් දමා වලවල් වසා ගමන්කළ හැකි පරිදි සකස් කරදීමට කටයුතු කරන ලෙස ගරු භාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය දිනවල පාර්ලිමේන්තුවේ දෙමළ නියෝජනය කරන මන්ත්‍රීවරුන් සියළුම දෙනා පක්ෂ භේදයකින් තොරව දමිළ ජනතාව පිළිබඳව කතා කළා ඔවුන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වන බව එතුමා පැවසුවේය.

**ix.ගරු මන්ත්‍රී ප්‍රියන්ත පෙරේරා මහතා**

දිගින් දිගටම අහපු ප්‍රශ්ණයක් තමයි සමෘද්ධි ප්‍රශ්ණය පිළිබඳව පාට පක්ෂ භේදයකින් තොරව මෙවැනි කටයුතු වෙනුවෙන් විරෝධය එල කළ යුතු බවත් , වතු ජනතාව කියන්නේ ඉතාමත් දිළිඳු පිරිසක් ඔවුන්ට හිමි මුදල්සොරකම් කරනවා නම් එසේ කළ සියළු දෙනාට දඩුවම් කළ යුතු බව එතුමා සඳහන් කළේය.
මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්තුමිය හරහා පරීක්ෂනයක් සිදුකරන ලෙසට දැනුම් දෙන ලෙස එතුමා ඉල්ලීමක් කළේය.

බෝතුංග ආරච්චි මන්ත්‍රී තුමා හා මා විසින් දිගින් දිගටම සිසුසැරිය බස් රථයක් ලබා ගැනීම සම්බන්ධව කතා කළා. සමන්සිරිගම ඇත්තොට හරහා රත්ගහ දක්වා බස් රථයක් ඉල්ලා සිටියා. සභා වාර්තාවේ අතිගරු ජනාධිපතිතුමා දැනුම්දෙන ලෙස ඉල්ලා සිටියා මං තමයි ප්‍රවාහන ගරු අමාත්‍යවරයාට ඉල්ලීමක් කරන ලෙස දැනුම් දුන්නේ. බෝතුංග මන්ත්‍රීතුමා ඉල්ලුවේ සමන්සිරිගම රත්තුරුගල හරහා සිසුසැරියක් මං ඉල්ලුවේ සමන් සැරිගම, ඇත්තොට , ගලබඩ හරහා තමයි. ඉල්ලුවේ මේ යෝජනා දෙකක වෙන වෙනම ගියානම් ගැටළු ඇති නොවන බව එතුමා පැවසුවේය.

කුඩාව ප්‍රදේශයේ අධිබලැති විදුලි රැහැන් පද්ධතියක් යනවා ලක්ෂ පාන සිට හම්බන්තොට දක්වා වැඩ ආරම්භ කර තිබෙනවා. අප ප්‍රෙද්ශයේ රක්ෂිත ප්‍රදේශවලින් විදුලි රැහැන් ඇදීම සඳහා විශාල දැව කපා ඉවත් කර තිබෙනවා. එම දැව කඳන් මේ වන විට දැව සංස්ථාවට බාර දී තිබෙනවා. ප්‍රාදේශිය සභාවෙන් හා විවිධ අමාත්‍යාංශයන් මගින් සකස් කරන ලද මාර්ග තිබෙනවා.ඉදිරියේදී මෙම මාර්ග හරහා දැව ප්‍රවාහනය කරන්න ඉඩ කඩ තිබෙනවා. ඒ නිසා විදුලි බල මණ්ඩලයට හා දැව සංස්ථාවට මෙම මාර්ග හරහා දැව ප්‍රවාහනය කිරීමේදී අවම වශයෙන් බර යොදා හෝ මාර්ග ආරක්ෂා වන පරිදි ප්‍රවාහන කටයුතු සිදුකරන ලෙස ඉල්ලා ලිපියක් යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

**x.ගරු මන්ත්‍රි ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා**

අද දින සභාවට එන විට සභාව අලංකාර කර තිබෙනවා දුටුවාම ඒ ගැන ආඩම්බරයි. නමුත් ඇතැම් මන්ත්‍රීවරුන්ට විපක්ෂයේ මෙන්ම අපේ පක්ෂයේ ඇතැමුන්ට මෙම පක්ෂය කැඩී බිඳී ගිය තත්වය පිළිබඳව පෙන්වීමට අවශ්‍යා බවද, කෑම බීම හිඟ කම ආදිය පෙන්වීමට අවශ්‍යතාවයක් ඇති බව එතුමා පැවසුවේය.

වතුකරයේ ජනතාවගේ ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරයෙක් විදියට වතු ජනතාව පිළිබඳව කතා කළ යුතු වෙනවා. මං හැමදාම කතා කරනවා ශ්‍රී ලංකාවේ පීඩාවට පත්වුණු ජනතාවක් ඇත්නම් ඒ තමයි වතුකරයේ ද්‍රවිඩ ජනතාව. වතු පාලන අධිකාරිය විසින් පීඩාවට පත්කරන විට මේ සමෘද්ධි සහනාධාරය තුළිනුත් පීඩාවට එම ජනතාව පත්වන්නේ නම් එම සිද්ධිය තරයේ හෙලා දකින බව එතුමා සඳහන් කළේය. මේ සම්බන්ධව කුමක් හෝ යමක් සිදුවී තිබෙනවා නැත් මේවා සමාජ මාධ්‍ය ජාලා වල යන් නැහැ. මිනිසුන් කතා බහට ලක් නොකරන බව එතුමා සඳහන් කළේය. එක් මන්ත්‍රීවරයෙන් සමෘද්ධි නිලධාරියා නිර්දෝෂී කිරීමට උත්සහා දැරුවා ඒ අතරේ එම නිලධාරිය තමන්ට සෑම අවස්ථාවකම එක්මුතුව වැඩ කළ කෙනෙකු හැටියටත් පෞද්ගලිකව ඥාති සම්බන්ධතා තිබුණත් මේ අවස්ථාවේදී මෙම ගැටළුව පිළිබඳව මේ සභාව ඉදිරියේ නොසඟවා කතා කිරීම පිළිබඳව මාගේ ගෞරවය ස්තුතිය පුද කරන බව එතුමා ප්‍රකාශ කළේය.

මෙම කාරණය පරීක්ෂණ කිරීම සඳහා ජනාධිපතිතුමා ලඟට, අමාත්‍යවරයා ලඟට , දිස්ත්‍රික් ලේකම් ලඟට ප්‍රාදේශිය ලේකම් ලඟට යන්නට අවශ්‍යතාවයක් නොමැති බවත් මෙය සමෘද්ධි අධිකාරිය මගින්ම පරීක්ෂනයක් අදාල නිලධාරියා මීට සම්බන්ධතාවයක් තිබේනම් දඩුවම් ලබා දීම සිදුකළ යුතු බව එතුමා පැවසුවේය.

අපි මේ උපදෙස් ලබා දෙනවා නෙවෙයි මුලින්ම මේ පරීක්ෂනයක් කිරීමට කලින් කළ යුතු වන්නේ අදාල නිලධාරියා වෙනත් ස්ථානයකට මාරු කිරීමයි. අනතුරුව පරීක්ෂණය කළ යුතු වන්නේ එසේ නොවුන හොත් මිනිසුන්ගේ නිවැරදි තොරතුරු ලබාගත නොහැකි බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. අද වන විට

මැති ඇමතිවරුන්ට වඩා නිලධාරී තමයි ගසා කන්නෙ අසරණ මිනිස්සුන්ට ලබාදෙන සමෘද්ධි සහනාධාරය ගසාකෑමට ලක්කරනවා නම් කොයිතරම් නම් නින්දිතද යන්න එතුමා පැවසුවේය. මේ පිළිබඳව ගරු උප සභාපතිතුමනි ඔබතුමාත් මේ සමෘද්ධියට සම්බන්ධ බැවින් සොයා බැලීමට කටයුතු කරන්න. ඒ වගේ අඛිල මන්ත්‍රීතුමා පැවසුවා තමනුත් සමෘද්ධි නිලධාරියෙකු වශයෙන් සේවය කළ කෙනෙකු හැටියට සමෘද්ධි වැඩ සටහන අපකීර්තියට ලක්වනවාට අකමැති බව, නමුත් මම නම් කෙලින්ම චෝදනා කරන්නෙ සමෘද්ධි නිලධාරීන්ට තමයි. මේ පිළිබඳව පරීක්ෂන පවත්වන්න ඇයි පරක්කු. කුමක් හෝ දෙයක් සිද්ධ වෙලා තියෙනවා. මහා පරිමාණයෙන් මිනිසුන්ගෙන් චෝදනා ලබලා තියෙනවා. තම්බිරාජ මන්ත්‍රීතුමා ජනතාවගේ පැත්තේ සිට කතා කිරීම සම්බන්ධව නැවත වතාවක් ස්තූති වන්ත වන බව එතුමා පැවසුවේය.

ගුරුබැවිලාගම කොට්ඨාශයේ මාර්ග කිහිපයක් අධික වර්ෂාව හේතුවෙන් අබලන් වී ඇති බව මම දැනුම් දුන්නා සභාවට අනතුව කාර්මික නිලධාරී මහත්මයාත්, කලින් සටි ලේකම් තුමියත්, පසුව වර්තමාන ලේකම් තුමියද පළාත් සභාවේ නිලධාරීන්ද ඇවිත් පරීක්ෂා කර බැලුවා නමුත් තවමත් ඒ පිළිබඳව කිසිවක් සිදුවී නැහැ. මේ පිළිබඳව අවධානය යොමු කරමින් අවශය කටයුතු කරදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

**xi.ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

ඉලුක්වත්ත රත්තුරුගල මාර්ගය මේ වන විට කාපට් ඇතිරීම සිදුකරගෙන යනවා එහිදී පොළවේ මට්ටමේ සිට සෙන්ටර් එක ගද්දී ඇතැම් ස්ථානවල අඩියක් විතර ඉස්සෙනවා. එහෙම වුනාම ඉලුක්වත් හංදියේ හලපු ත්‍රීවිල් අංගනයට දැමූ කොන්ක්‍රීට් එක මාර්ගයට වටා පහළින් තමයි තියෙන්නේ එදේ වුනහම වතුරට යටවෙනවා. ත්‍රීරෝද රථ ගාලට නැවත කොන්ක්‍රීට් කිරීමට හැකියාවක් නොමැති නිසා මේ මාර්ගයේ වැඩකටයුතු අවසන් වීමට ප්‍රථම මේ පිළිබඳව අවධානය යොමු කර විසඳුමක් ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

සමෘද්ධි ආධාර බෙදාදීමේ වැඩ සටහන තුළ සිදුවූවායැයි කියන අසාධාරණය සෑම තැනම කතා බහට ලක්වෙනවා. අපේ පක්ෂ මූලාස්ථානයටත් දැනුම් දී තිබුණා . මාත් මේ පිළිබඳව කිහිප දෙනෙකුගෙන්ම විමසීමක් කරනු ලැබුවා ඒක සෑම කොනෙකුම දන්නා රහසක් බවට පත්වී තිබෙනවා. එක් නිලධාරියෙකු සිටිනවා ඔහු සෑම වැඩ කටයුත්තකදීම මූලිකත්වය ගෙන කටයුතු කරන කෙනෙක් ඒ නිසා මේ පිළිබඳව කොතැනට ගියත් ජනතාවට සාධාරණයක් වී නැහැ. ඒ නිසා මේ පිළිබඳව පරීක්ෂනයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස එතුමා පැවසුවේය.

**xii.ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා**

නිලන්ති මන්ත්‍රීතුමියගේ කොට්ඨාශයේ වීජී පහන් විසි හයෙන් හයක් ලබා දුන්නැ කියලා සඳහන් කළා නැවත වීජී පහන් ලබාදෙන අවස්ථාවේදී එම වීජී පහන් ලබාදෙන ලෙස සටහන් කරගන්නා ලෙස ගරු උප සභාපතිතුමා සඳහන් කළා.

අඛිල මන්ත්‍රීතුමා සඳහන් කළ කම්බි පාළම් සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට දන්වා යැවීම සුදුසු බවත්, සභාවෙන්ද මේ පිළිබඳව පරීක්ෂා කර බලා කටයුතු කළයුතු බව එතුමා සඳහන් කළේය.
අද කතා කළ සමෘද්ධි ප්‍රශ්ණය පිළිබඳව ඇත්තද නැත්තද කියා සොයා බැලිය යුතු බවත් , පළමුවෙන්ම මේ පිළිබඳව සොයා බැලිය යුතු වන්නේ සමෘද්ධි බැංකුවේ කළමණාකරුවෙක් සිටිනව ඔහු විසින් බවත්, ප්‍රාදේශිය ලේකම් තුමියට දැනුවත් කළාට පසුව පළමුවෙන්ම එතුමියත් මේ ගැන සොයා බැලිය යුතු වෙනවා. සමෘද්ධි අමාත්‍යාංශය යටතේ තිබෙන අභ්‍යන්තර විගණන විමසුම් අංශයක් තියෙනවා එයට දැනුම් දුන්නාම මේ පිළිබඳව සත්‍ය සොයා දෙන බවද එතුමා සඳහන් කළේය. මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බවත්, එසේ නොවුන හොත් සමෘද්ධි ව්‍යාපාරයටම කැළලක් වන බව එතුමා සඳහන් කළේය.

ප්‍රාදේශීය සභාව තුළ ඊට අදාල විෂය නොමැති බැවින් කෘෂිකර්මය පිළිබඳව අවධානය යොමු කරන්නේම නැති තරම් , යෝජනාවක් හැටියට කරනවා කෘෂිකර්මය පැත්තෙන් යම්කිසි දායකත්වයක් සභාවක් ලෙස යොමු කරන්න කියලා .ඉදිරියේදී සිදුවිය හැකි ආහාර හිගයට විසඳුමක් ලෙස ඒ පැත්තට සභාවේ අවධානය ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කරනවා.
සභාවේ අයවැය සම්බන්ධ කාරණා විශාල වශයෙන් කතා කළ අද දවසේ විවිධ අංශ වලට අදාලව කරුණු රාශියක් කතා බහට ලක් වුනා ඒ සඳහා කරුණු ඉදිරිපත් කළ සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දින මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**